**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධිපාඨමාලාව - තුන්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය (විවෘත ග්‍රන්ථ -මාර්ග ගත ) – 2020/2021**

**LLU3904 /LWU1412- නීති ක්‍රම**

**කාලය පැය තුනයි (03)**

---

**දිනය: 2021 සැප්තැම්බර් 08** **වේලාව: පෙ. ව. 09.30 – ප.ව. 12.30**

---

**මුළු ප්‍රශ්ණ ගණන 06.**

**<u>එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් බැගින් තෝරාගෙන ප්‍රශ්ණ හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**අපහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

## <u>I වන කොටස - රෝම නීතිය</u>

1. රෝම පුරවැසියකු වන මාර්කස් ට පෝලිනස් සහ නීරෝ නම් වූ පුතුන් දෙදෙනෙකු ද අවුරේලියා නම් දියණියක ද සිටී. පෝලිනස් රෝම පුරවැසි කාන්තාවක් වූ පෝෂියා සමග වසර ගණනාවක් තිස්සේ සහවාසයේ වෙසෙන අතර ඔවුනට දරුවන් දෙදෙනෙකු වෙති. අවුරේලියා බෲටස් සමග නිදහස් විවාහයකට එළඹුන අතර ඔවුනට ද දරුවන් දෙදෙනෙකු වෙති.

   පහත දැක්වෙන මාර්කස්ගේ ක්‍රියාවන්හි නීත්‍යානුකූල භාවය සාකච්ඡා කරන්න.

   (අ) මාර්කස් සහ ඔහුගේ අසල්වැසියා වූ රොමානෝ එකිනෙකා සමග අමනාපයෙන් පසුවූ අතර තම පවුලේ සාමාජිකයන් හට රොමානෝගේ වත්තට ඇතුළු වීම මාර්කස් විසින් තරයේ තහනම් කර තිබුණි. දිනක් පෝලිනස්ගේ දරුවන් දෙදෙනා තමන්ගේ සුරතල් හාවා සොයමින් රොමානෝගේ වත්තට ඇතුළු වූ අතර ඉන් පිටව යද්දී ගේට්ටුව වසා යාමට ඔවුන්ට අමතක විය. රොමානෝගේ ගව රංචුව ඉන් පිටතට පැන ගිය අතර උන් සොයා ගත නොහැකි වුණි. මෙම සිද්ධිය අසා ඇඩිසේ කෝපයට පත් මාර්කස් එක් දරුවකු මරණයට පත් වන තෙක් පහර දුන්නේය. තමන්ට සිදුවූ අලාභය වෙනුවෙන් වන්දි ඉල්ලා සිටි රොමානෝට මාර්කස් විසින් අනෙක් දරුවා වන්දි වශයෙන් භාර දුන්නේය.

(ලකුණු 12)

(ආ) රෝම හමුදාවේ සේවය කිරීමෙන් පෝලිනස් විසින් රන්කාසි (Aureus) 1000 ක් උපයා ගන්නා ලදී. එම මුදල යොදවා ඇපල් වත්තක් මිලදී ගැනීමට ඔහු අදහස් කරයි. මාර්කස් එම අදහසට විරුද්ධ වන අතර පවුලේ පරිහරණය පිණිස අශ්වයෙක් සහ කරත්තයක් මිලට ගැනීම සඳහා එම මුදල යොදවන ලෙස ඔහු පෝලිනස්ට නියෝග කරයි.

(ලකුණු 07)

(ඇ) ධනවත් ඉඩම් හිමියකු වූ ලොතාරියෝ ගේ එකම දියණිය වූ වීනස් විවාහ කර ගැනීමට නීරෝ අදහස් කරයි. විවාහ වීම සඳහා නීරෝ තවත් වසර කීපයක් සිටිය යුතු බවත් එසේ ඔහු විවාහ විය යුත්තේ තමා යෝජනා කරන කෙනෙකු සමග බවත් දක්වමින් මාර්කස් ඒ සඳහා කැමැත්ත නොදෙයි.

( ලකුණු 06)

( මුළු ලකුණු 25)

2. ටයිටස් සහ ඔහුගේ වහලා වූ සුල්ලා, අලෙවි කිරීම සඳහා තිරිඟු තොගයක් රැගෙන වෙළඳපළට ගියහ. ඔවුන් වෙළඳපල හරහා ගමන් කරමින් සිටියදී ඉදිරියට පැමිණි කැස්කා සහ ඩේරියස් ඔවුන්ගේ මඟ අහුරා ටයිටස් ට අපහාස කරමින් දෙදෙනාටම පොලු මුගුරු වලින් පහර දුන්හ. මෙම පහර දීමෙන් ටයිටස්ගේ ශරීරයේ අස්ථි බිඳීමක් සිදු වූ අතර, හිසට සිදුවූ හානි හේතුවෙන් සුල්ලා මරණයට පත් විය. තිරිඟු ගෝනි ඉරී ගොස් හානි වීමෙන් මාර්ගය පුරාම තිරිඟු විසිරී ගියේය.
ටයිටස්ගේ මිත්‍රයකු වූ ගයස් නැමැති උසස් නිලධාරියා එම අවස්ථාවේ එතැනට පැමිණි අතර කැස්කා ගයස් වෙත ගල්කැට වලින් දමා ගැසුවේය.

ඉහත දැක්වෙන සිද්ධියෙන් පැන නගින නෛතික කරුණු සාකච්ඡා කරන්න.

( ලකුණු 25)

3. පහත දැක්වෙන අවස්ථාවන්හිදී පැන නගින නෛතික අනුෂාංග සාකච්ඡා කරන්න.

(අ) සියලු අවශ්‍යතා සඳහා ජූලියානෝ ගේ ඉඩම මතින් ගමන් කිරීමේ සාමාන්‍ය අයිතියක් ඇන්තනිට තිබුණි. ඔස්කා එම ඉඩම ජූලියානෝ ගෙන් මිලදී ගත්තේය.

(ආ) ඔගස්ටස්ගේ නිවස පරිහරණය කිරීමේ හා භුක්ති විඳීමේ අයිතියක් ක්ලෝඩියස්ට තිබුණි. ක්ලෝඩියස් එම නිවස සම්භාෂණ ශාලාවක් බවට පරිවර්තනය කළේය.

(ඇ) ජුලියස්, ණය මුදලකට ඇපයක් වශයෙන් තම අශ්වයා සිල්වියස්ට භාර දුන්නේය. අශ්වයා සිල්වියස්ගේ නිවසේ වහලකුට පා පහරක් දී තුවාල සිදු කළේය.

(ඈ) ඩයනාගේ නිවස ගින්නකින් විනාශ වූ බැවින් ඩයනා තම වටිනා මැණික් එබ්බවූ ආභරණ කිහිපයක් සුරක්ෂිතව තබා ගැනීම පිණිස අයෝනා ට භාර දුන්නාය. අයෝනා එම ආභරණ ආපසු දීම ප්‍රතික්ෂේප කළාය.

( ලකුණු 25)

## II වන කොටස - නීති ක්‍රම

4. සිල්වා මහතා අද දින ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු මඬුල්ලක් ඉදිරියේ A,B සහ C යන කරුණු මත පදනම් වූ නඩුවක් සඳහා තර්ක ඉදිරිපත් කරයි.

ඔබේ මතය තහවුරු කිරීම සඳහා උචිත අධිකාරයන් දක්වමින් පහත දැක්වෙන නඩු තීන්දු වල අදාලත්වය පිළිබඳව සිල්වා මහතාට උපදෙස් දෙන්න.

(අ) A,B සහ C යන කරුණු මත පදනම් ව ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ලක් විසින් 1989 දී දෙන ලද තීන්දුවක්.

(ආ) A සහ B යන කරුණු මත පදනම් ව ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ණ විනිසුරු මඬුල්ලක් විසින් 2020 දී දෙන ලද තීන්දුවක්.

(ඇ) A,B, C සහ D යන කරුණු මත පදනම් ව රාජාධිකරණය විසින් 1979 දී දෙන ලද තීන්දුවක්.

(ඈ) A,B සහ C යන කරුණු මත පදනම් ව ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ණ විනිසුරු මඬුල්ලක් විසින් 1965 දී දෙන ලද තීන්දුවක්.

( ලකුණු 25)

5. නාගේස්වරම් හි පිහිටි ශ්‍රී නාග භවන් යනු පුදපූජා සඳහා ප්‍රසිද්ධ වූ ස්ථානයකි. විවිධ ආගම් වලට අයත් බැතිමත්හු ආශීර්වාද ලබාගැනීම පිණිස ශ්‍රී නාග භවන් වෙත පැමිණියහ. සෑම වසරකම අගෝස්තු මාසයට යෙදෙන වාර්ෂික මංගල්‍යයේදී ශ්‍රී නාග දෙවියන් වෙනුවෙන් එළුවන් බිලිදීමේ පූජාවක් පැවැත්වේ. මෙම වසරේ පැවැත්වූ වාර්ෂික මංගල්‍යයේදී බොහෝ දෙනා පූජා

භූමිය වෙත එළුවන් රැගෙන ආ අතර ඉතා කෲර අන්දමින් එලිමහනේදීම එළුවන් ඝාතනය සිදු කරන ලදී. සතුන් බිලිදීමේ කටයුතු සඳහාම විශේෂයෙන් සකස් කල මඩුවක් තුල එළුවන් රඳවා තැබිණි. ඝාතනය කල එළුවන්ගේ මාංශ වලින් එක් කොටසක් අලෙවි කළ අතර ඉතිරි කොටස වාර්ෂික මංගල්‍යය සඳහා පැමිණ සිටි අය අතර නොමිලේ බෙදා දෙන ලදී.

සත්ව හිංසාව වැළැක්වීම සහ සතුන් ආරක්ෂා කිරීම වෙනුවෙන් ක්‍රියා කරන 'හිත මිතුරෝ' නමැති රාජ්‍ය නොවන සංවිධානයක්, සත්ව හිංසා වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදනයන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී නාග භවන් හි භාරකාර මණ්ඩලයට එරෙහිව නඩු පැවරීමට අදහස් කරයි. තමන්ට එරෙහි මෙම චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරමින් ශ්‍රී නාග භවන් හි භාරකාර මණ්ඩලය තර්ක කර සිටින්නේ එළුවන් බිලිදීම පසුගිය වර්ෂ 150 ක කාලයක් පුරාම අනුගමනය කල දීර්ඝ කාලීන ආගමික චාරිත්‍රයක් බවත්, එබැවින් එම චාරිත්‍රය වාර්ෂිකව පැවැත්වීමට නෛතික අයිතියක් තමන්ට පවතින බවත් ය.

ශ්‍රී නාග භවන් හි පවත්වන මෙම චාරිත්‍රයේ වලංගු භාවය පිළිබඳව 'හිත මිතුරෝ' ඔබගේ උපදෙස් පතයි. චාරිත්‍රයක් වලංගු වීම සඳහා සම්පූර්ණ කලයුතු අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් ඔවුනට උපදෙස් දෙන්න. යෝග්‍ය නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

( ලකුණු 25)

6. 2018 ඡන්ද හිමි නාම ලේඛනයේ ඡන්ද දායකයකු වශයෙන් ලියාපදිංචිව සිටි කුසල් එම වසරේදීම රිය අනතුරකින් මියගියේය. 2019 දී මහ මැතිවරණයක් පවත්වන ලද අතර , 2018 ඡන්ද හිමි නාම ලේඛනය පදනම් ව ලියාපදිංචි ඡන්ද දායකයකු වශයෙන් කුසල් නාම ලේඛනයට ඇතුලත් වී තිබුණි. මැතිවරණය පවත්වන ලද දිනයේ කුසල්ගේ ඡන්ද කාඩ් පත රැගෙන ඡන්ද මධ්‍යස්ථානයට ගිය රන්ජන් තමා කුසල් බව අඟවමින් එහිදී ඡන්දය ප්‍රකාශ කළේය. ' ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති පුද්ගලයකු ලෙස ව්‍යාජව පෙනී සිටීම නීති විරෝධී වේ' යනුවෙන් මැතිවරණ පනතේ සඳහන් ප්‍රතිපාදන යටතේ අන්‍ය පුද්ගලයකුගේ ඡන්දයක් භාවිතා කිරීම යන වරද සම්බන්ධයෙන් රන්ජන් ට එරෙහිව චෝදනා නැගී ඇත. ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති පුද්ගලයකු ලෙස ව්‍යාජව පෙනී සිටීමට හැකි වුවද මියගිය පුද්ගලයකුට සැබවින්ම ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකිය යනුවෙන් දක්වමින් ඉහත කී වරද සම්බන්ධයෙන් තමාට එරෙහිව චෝදනා ගෙන ඒමට නොහැකි බව රන්ජන් තර්ක කරයි.

ව්‍යවස්ථා අර්ථ නිරූපනය පිලිබඳ රීති සහ පූර්ව නිගමන ආශ්‍රයෙන් රන්ජන්ගේ තර්කයේ වලංගු භාවය පරීක්ෂා කරන්න. යෝග්‍ය නඩු තීන්දු මගින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

( ලකුණු 25)

**----------හිමිකම් ඇවිරිණි--------**